# තංගලෙයි මාතරෙයි හරහා අම්බලන්තොටෙයි දක්වා වූ විපිරියාසය

## උතුරු - නැඟෙනහිර ඉතිහාසය පෙන්වන ඉපැරැණි සිංහල ස්ථාන නාම

**මහාචාර්ය චන්ද්‍ර ධර්මවර්ධන**

**(කැනඩාවේ ජාතික පර්යේෂණ මණ්ඩලයේ සහ මොන්ට්‍රියල් විශ්ව විද්‍යාලයේ නියුක්ත මේ ලේඛකයා එකල විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උප කුලපති වශයෙන් ද කටයුතු කෙළේය.)**

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිෂන් සභාවට දෙමළ සංවිධාන මගින් ඉදිරිපත් කොට ඇති ලිපියක ලංකාවේ දකුණු පළාත විස්තර කොට ඇත්තේ මෙසේය.

British established Five Provinces in 1833

The Southern Province: Galle, Thangalai, Matarai and Ambalanthotai, stretching as far as Ratnapura. The capital was Galle.

එනම් ගාල්ල, තංගලෙයි, මාතරෙයි සහ අම්බලන්තොටෙයි දක්වා රත්නපුර දක්වා දික්වේ.

මේ අන්දමින් නිරන්තරව දෙමළ ආකාරයක් ගත් ස්ථාන නාම භාවිතා කිරීමෙන් ඔවුන් ඉතිහාසය නොපිටට පෙරළීමට තැත් කරති. ඇත්ත වශයෙන් උතුර සහ නැඟෙනහිර ඇති ස්ථාන නාම වලට ඓතිහාසික ඉපැරැණි සිංහල නාම ඇති වුවද දැනට දෙමළ නාමයන් පමණක් පාවිච්චි වෙයි. දැනට සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා ලෙස පිළි අරගෙන තිබෙන හෙයින් සිංහල ස්ථාන නාමවලට හිමි ස්ථානය දිය යුතු ය.




මෙතෙක් කල් දෙමළ ත්‍රස්තවාදීන්ගේ බලයට යටවී තිබුණු අරුණු දිග (නැඟෙනහිර පළාත) නොබෝද නිදහස් කෙරුණේ අපේ හමුදාවේ වීරෝදාර ප්‍රයත්නයේ හේතුවෙනි. එවිට අපේ පත්තර "වහාරයි", "වෙරුකල්", "පනිච්චන්කර්නි"" වැනි දෙමළ ස්ථාන නාම සඳහන් කළහ. එසේම, දෙමළ ත්‍රස්තයන් තිරිකුණාමලයට ආසන්න 'මාවිල්ආරු' නමැති ග්‍රාමයක පිහිටි දිය සොරොව්වක් සාහසික ලෙස වැනසූ ආකාරය පත්තරවල පළ විය.

එයින් ඇතිවූ සටන 'තිරිකුණාමලයේ' ටද 'මුත්තූර්, 'සාම්පූර්', 'කල්ලාර්' යනාදී ප්‍රදේශ වලට ද පැතිරී ගිය ආකාරය ද ප්‍රවෘත්ති පත්‍රවල පළ විය. එහෙත් 'වකාරයි', 'මාවිල්ආරු', 'මුත්තූර්', 'සාම්පූර්', කල්ලාර්' පමණක් නොව තිරිකුණාමලය යන නමද ඉපැරණි ඉතිහාසයක් ඇති හෙළදිවේ වූ ස්ථාන නම් දැයි විමසිය හැක. 'උතුර සහ අරුණ දෙමළ නිජභූමි' යයි ඊළම් කාරයෝ තර්ක කරන්නේ මෙවැනි දෙමළ වෙස් ගත් ග්‍රාම නාමයන් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරමිනි. ඉතිහාසය නොදන්නා සමහර ප්‍රබලයෝ ද ඊළම් මතධාරීහු ද නොයෙක් රාජ්‍ය ව්‍යවස්ථා ක්‍රම ඉදිරිපත් කරමින්, රටේ ඒකීය තත්ත්වය ඌන කරමින් රට බෙදන්නට යෝජනා කොට ඇත. මෑත කාලයක් වනතෙක් සිංහල නම් වලින් හැඳින්වූ මේ ගම්වල පැරැණි නම් නැවත භාවිතයට ගෙන, උතුර සහ අරුණ කුමන භාෂිතයන්ගේ නිජබිමක් දැයි නැවත පැහැදිලිව සඳහන් කළ යුතුය.

එකල පැරකුම් රජු දැනට තිරිකුණාමලය නමින් දන්නා වරායෙන් බුරුමයට නැව් යැව්වා නම්, ඒ වරායේ එකල නම කුමක් විය යුතු ද? සියයට 75 ක් සිංහල භාවිතා කරන ජනකායක් ලංකාවේ සිටිති. අපේ සිංහල ලේඛකයෝ දෙමළ – පරංගි – ලන්දේසි – ඉංග්‍රීසි යටත් විජිත සමයේදී පුරුදු වූ නාමයන් අදත් භාවිතා කරති. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ මුල් සිංහල නම් පැහැදිලිව දක්වා තිබෙන පොත් පත් හෝ ලේඛන නොමැති වීමයි.

දැනට භාවිතා වන දෙමළ රූපයක් ගත් ස්ථාන නාම යථා ලෙස පරීක්ෂා කළ විට ඒවා සිංහලයෙන්ම බිඳී ආ නම් බැව් පැහැදිලි වේ. එද ඉංග්‍රීසි සිවිල් සේවයේ කටයුතු කළ හොස්බර්ග් මහතා 1916 දී "සිලෝන් ඇන්ටික්වේරියන්' නමැති ශාස්ත්‍රීය සඟරාවට ලිපියක් සපයමින් යාපන ප්‍රදේශයේ ඇති බොහෝ ග්‍රාමයන්ගේ නාම දෙමළ ආකාර ගත් සිංහල නම් බව පෙන්වා දුන්නේය. උදාහරණ වශයෙන් 'චුන්නාකම්' යනු 'හුණුගම' බව ද 'වලික්කාමම්' 'වැලිගම' බව ද දැක්විය හැකිය. වියත් දෙමළ ලේඛකයෝ ද මේ බව පිළිගනිති. ඊළම් කාරයන්ගේ අඩන්තේට්ටම්වලට යටත් නොවී නිදහසේ ලිපි පළ කිරීමට ඉඩ තිබුණු කාලයේ පළවූ කෘති මේ අතින් ඉතා අගනා වේ. කාතිගේසු ඉන්තිරපාලන් මහතාගේ 1965 දී පළ වූ ආචාර්ය උපාධි කෘතියේ යාපනයේ ස්ථාන නාම පිළිබඳ දීර්ඝ විග්‍රහයක් පළ විය. එසේම එල්ලාවල මේධානන්ද හිමි, පෝල් ඊ. පීරිස්, සෙනරත් පරණවිතාන, අරිසෙන් අහුබුදු ඇතුළු නොයෙක් වියතුන්ගේ ලිපිවලින් ද, අප විසින් කෙරුණු ගවේෂණවලින් ද, දෙමළට යට වී තිබුණු පැරැණි නම් රාශියක් දැන් හෙළි වී ඇත.

'යාපාපටුන' වැනි සිංහල නම් 'යාල්පානම්' නොහොත් යාපනය බවට හැරුණේ සොලී ආක්‍රමණවලින් පසුවය. ලන්දේසි කාලයේ දී පවා 'බටකෝට්ටේ' යනුවෙන් හැඳින්වූ නගරය දැන් 'වඩුක්කොඩෙයි' බවට හැරී ඇත. එද 'මූලදූව', 'වලස්හේන' නමැති සිංහලයන් අර්ථවත් වූ ස්ථාන නාම අද 'මුලතිව්', 'වාලච්චේනෙයි' යන දෙමළ ආකාරය ගෙන ඇත. මේ දෙමළ ස්වරූපී නම් සම්පූර්ණයෙන්ම අර්ථ රහිත දෙමළ ශබ්ද බව සැලකිය යුතුය.

පැරකුම් රජ කාලයේදී සහ ඉන් පෙරද තිරිකුණාමලයට 'ගෝනකන්න' යන නම ව්‍යවහාර විය. මුහුදේ සිට ගොඩ දෙස බැලූ විට ගෝනකුගේ හැඩයක් ගත් කන්දක් ලෙස පෙනුණු හෙයින් 'ගෝනකන්ද' යන මුල් නාමය ඇති විය. ඒ කන්ද මත වූ පන්සලට 'සිරිගෝන කන්ද' යන නම දී තිබුණි. මේ නම දෙමළට බිඳීමේ දී 'සිරි' යන ශබ්දය 'තිරු' බවට හැරිණි. තවද 'ගෝනකන්ද' යන්න 'කෝනමලයි' බවට හැරිණි. එසේ බිහිවූ 'තිරිකුණාමලයට' යුරෝපීය උච්චාරකයෝ 'ට්‍රිංකොමලී' බවට හරවා ගත්හ. තිරිකුණාමලය යන නමට දැන් ශතවර්ෂ කිහිපයක ඉතිහාසයක් ඇත. එහෙත් 'ගෝකන්න' යන නමට ඊටත් වඩා දීර්ඝ ඉතිහාසයක් හා වැදගත්කමක් ඇත.

නොබෝද යුද සටන් වලට යොමුවූ 'මාවිල් ආරු' සොරොව්වේ සිංහල නම 'මාවිල් ඔය' බැව් කල්පනා කිරීමට පහසුය. එසේම, 'සාම්පූර්' යනු කාවන්තිස්ස රජ කාලයේ පවා 'සෝමපුර' යන නමින් දත් ඉපැරැණි නගරයකි. "මුත්තූර්" යනු "ගෝකන්න" (ත්‍රිකුණාමලය) අසබඩ ඇති මුහුදුකරයේ පිහිටි නගරයකි. දහත්වන ශතවර්ෂයේ දී රොබට් නොක්ස් නමැති ඉංග්‍රීසි නාවිකයා සිංහල රජුගේ නිලධාරීන්ට භාරවූවේ මෙහිදීය. දැනට පැවතෙන "මුත්තූර්" යන නාමය "මුදුතොර" නමැති අර්ථ පැහැදිලි සිංහල නාමයෙන් බිඳී ආවක් ලෙස සැලැකිය හැක. "තොර" "තොට" හෝ "තර" යන ශබ්දය සිංහල නම් ගම්වල නිතර දක්නට ලැබේ. කොළඹට ආසන්න "මෝදර" නමැති නගරයේ නම ද "මුදුතර" යන්නෙන් ම නිරුක්ත වූ බව පෙනේ. එහෙත් ගෝකන්න අසල වූ මුදුතර දෙමළ ස්වරූපයක් ගනිමින් "මුත්තූර්" බවට හැරිණි.

අපේ හමුදාවන්ගේ බල කඳවුරක් වන "කල්ලාර්" ප්‍රදේශයේ නම "ගල් ආර" බව පැහැදිලිය. එසේම "කන්තලෙයි" ලෙස හඳුන්වන්නේ සිංහලයෙන් අර්ථවත් "ගන්තලේ" බව පෘතුගීසි සහ ලන්දේසි ලිපිවලින් පැහැදිලිව පෙනේ. සංචාරකයන්ගේ නිවාඩු තිප්පලක් වන "කල්කුඩා" එකල "ගල්තුඩාව" යනුවෙන් වහර විය. ලංකාවේ නැඟෙනහිර වෙරළේ ඇති තවත් සංචාරක තිප්පලක දැනට නම "ආරුගම්" බේ වෙයි. මෙහි පැරැණි නම "අරුණුගම" බවට ලිඛිත සාධක ඇති බව මහාචාර්ය මීගස්කුඹුර මහතා අපට දන්වා ඇත.

දෙමළ ත්‍රාස්තිකයන්ගේ මූලස්ථානය වන "කිලිනොච්චි" පැරැණි බෞද්ධ නටබුන් සහ වෙහෙරක් ද ඇති "ගිරානිකය" නම් වූ නගරය වෙයි. ලතින් භාෂාවෙන් "විටෙක්ස් නුගෙන්ඩෝ" යනුවෙන් උද්භිද විද්‍යාවේ හඳුන්වන්නේ සිංහලයෙන් 'නික' නමැති ගසටය. 'නික' ශබ්දය දෙමළෙන් "නොච්චි" යන ස්වරූපය ගත් බව පැහැදිලිය. තවද මලයාලම්, කන්නාඩ වැනි දෙමළට ඉතා කිට්ටු භාෂාවන්හි 'නික' ගසට 'නොස්සි' යන නම යෙදෙන බව තවදුරටත් සාක්ෂි වෙයි. 'කිලි' යන ශබ්දයෙන් 'ගිරා' ලැබෙන හෙයින්, කිලිනොච්චි යනු 'ගිරානිකය' යන සිංහල නාමයේ කිට්ටු දෙමළ පරිවර්තනයක් ලෙස සැලැකිය හැකිය. 'නික' ගස් ඇති කැලයක ගිරවුන් රැසක් සිටි නිසා 'ගිරානිකය' නමැති සිංහල නම බිහිවෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

දහතුන්වන සියවසේදී මාඝ ආක්‍රමණිකයෝ ලංකාවට ගොඩ බැස්සේ මහාවංසයේ "මධුපාතොට" යන නමින් දක්වා ඇති, මන්නාරම (මාන්තොට) ආසන්න වරායක් උපයෝගී කර ගනිමිනි. අද ඒ ස්ථානය "ඉලුප්පයිකඩවයි" යනුවෙන් හැඳින්වේ. වංශ කථාවල "මධුපා" යනුවෙන් සඳහන් වන්නේ සරල සිංහලයෙන් 'මී' නමැති ගස් වර්ගයයි. මී ගසට දෙමළ නම වන 'ඉලුප්පයි' යන්න ද "කරවිය" වෙනුවට "කඩවයි" ද යොදා ගැනීමෙන් පැරැණි සිංහල නම මාඝයන් යටතේ දෙමළ ස්වරූපයක් ගත් ආකාරය පැහැදිලිය.

මඩකළපුව අසල "එරාවූර්" නමැති, ප්‍රධාන වශයෙන් මුස්ලිමුන් වසන නගරයක් ඇත. එල්ලාවල මේධානන්ද හිමි එහි මුල් නම "එරාහුළු" විය හැකි යැයි විමසා ඇත. අපේ අදහස් අනුව, "එරාවූර්" හි මුල් නම "සේරපුර" වේ. මෙහි "සේරා" යන ශබ්දය "එරා" බවට බිඳී පුර යන ශබ්දය එම අර්ථයම ඇති දෙමළ "වූර්" බවට පත්වී එරාවූර් බිහි විය.

එද මාන්තොට සිට අනුරාධපුරයට රජ රැජිණන් මෙන්ම සාමාන්‍ය ජනයා ද පැමිණියේ මල්වතු ඔය දිගේ යාත්‍රා කරමිනි. දිගින් මහවැලි ගඟට පමණක් දෙවෙනි වන මෙම ගඟට "ආරුවි ආරු" යන නම 19 වන සියවසේදී ඉංග්‍රීසි මිනින්දෝරුවරු, ඔවුන්ගේ දෙමළ කුලීකරුවන්ගේ බස අනුව සනාථ කළෝය. මේ විශාල අයුක්තිය නිසා දැනට මල්වතුඔය යන නම නැතිවී, ලංකා සිතියම්වල "ආරුවි ආරු" පමණක් දක්නට ලැබේ.

සෑම නගරයක් සහ එහි නාමය පිළිබඳ රමණීය ඉතිහාස සටහන් ඇත. ඒ සියල්ල ගැන විමසා, ඒ ඒ ගම්වලට අයිති පුරා වස්තු, ලිඛිත විස්තර ජන ප්‍රවාද වැදගත් සිදුවීම් ආදී විස්තර එක්කොට අපේ ස්ථාන නාමවල සැඟවී තිබෙන ඉතිහාසය අනාගතයට ද ගෙන යෑම කාගේත් යුතුකමකි. වියතුන්ට පමණක් නොව, කාටත් මේ ප්‍රයත්නයට උදවු දිය හැකිය. දෙමළ නම් වෙනුවට හැකිතාක් දුරට සිංහල නම් භාවිතයට ගත යුතුය.

සිංහල ස්ථාන නම් භාවිත කිරීමේ අරමුණ ඉටුකිරීමේ පහසුව සලකා උතුරු සහ අරුණු දිශාවන්හි ස්ථාන නාමයන් රැසක සිංහල නම් සොයා පාවිච්චියට ගැනීමට පහසු ලේඛනයක් දැනට සකස් කොට ඇත. එසේම, පැරැණි සිංහල නම් දක්වන සිතියම් ද සකස්කොට ඇත. ඒ සිංහල ස්ථාන නාම ලැයිස්තුව අන්තර්ජාලයේ

(http://www. geocities.com/place.names/) යන ජාලතැන්නේ ("වෙබ්සයිට්") තැන්පත් කොට ඇත. ඒ ජාලතැන්නට පිවිස එය හොඳින් පරීක්ෂා කිරීමෙන් ඒ පිළිබඳ අවබෝධය ලබාගත හැකිය. ඉංග්‍රීසි බසින් දැනට පළකර ඇති එම ලිපිය නොබෝ කලකින් සිංහලයෙන් ද ඉදිරිපත් කිරීමට අදහස් කරමු.

මේ ස්ථාන නාම ලැයිස්තුව බැලූ විට එකම ගමට නම් දෙකක් තිබිය හැකි බව පෙනේ. "චුන්නාකම්" සහ "හුණුගම" යනුවෙන් එකම ගමට දෙභාෂාවෙන් නාම ද්විත්වයක් තිබීමේ ප්‍රශ්නයක් නැත. දෙමළෙන් ලියන විට දෙමළ නමද, සිංහලයෙන් ලියන විට සිංහල නමද භාවිතා කිරීම ඉංග්‍රීසියෙන් "ලන්ඩන්" කියන අතර ප්‍රංස භාෂාවෙන් "ලෝන්ඩ්‍ර" යන නම භාවිතා කිරීම වැනිය.

අපේ භටයෝ උතුරේ සහ නැගෙනහිර සිටින ත්‍රස්තවාදීන් දමනය කොට ඒ පළාත් නිදහස් කිරීමට දැන් කටයුතු කරති. පසුගිය අවුරුදු තිහක් ඇතුළත දෙමළ ත්‍රස්තවාදීන් නිසා ඒ පළාත්වල වූ පැරැණි පුරාවස්තුවලට විවිධ හානි සිදුවී ඇත. ඒ ප්‍රදේශයන්හි ස්ථාන නාම දෙමළ ආකාරයෙන් ගැනීමට පටන්ගත්තේ ශතවර්ෂ ගණනාවක් ඉහතදීය. එහෙයින් දෙමළ නාමයන් ද රටේ ඉතිහාසයට අයත් දේ ලෙස සැලැකිය යුතුය. එහෙත් ක්‍රිස්තු පූර්ව කාලයක සිට මැතක් දක්වා පැවති. පැරැණි ස්ථාන නාම අපට කිසිසේත් අමතක කළ නොහැකිය. මේ පැරැණි ස්ථාන නාම රටේ සම්පූර්ණ ඒකීයත්වය පැහැදිලිවම දක්වයි. ජනාධිපතිතුමාගේ "මහින්ද චින්තන" ප්‍රතිපත්තිය ද ශ්‍රී ලංකාවේ ඒකීයත්වය පදනම් කොට දක්වා ඇත. එහෙයින් මෙපැරැණි ස්ථාන නාම නැවත භාවිතයට ගැනීමෙන් ලංකාවේ සංස්කෘතික හා දේශීය ඒකීයත්වය තවත් තහවුරු වනු ඇත.